ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

# පුවත්පත් නිවේදනය

## <u>ටොන් 4000ක පාවෙන තටාකය සඳහා පදනම දැමීමේ උත්සවය</u>

M/s ගෝවා ෂිප්යාඩ් ලිමිටඩ් විසින් ශ්‍රී ලංකා නාවික හමුදාව වෙනුවෙන් ඉදි කරනු ලබන ටොන් 4000ක පාවෙන තටාකය සඳහා පදනම දැමීමේ උත්සවය 2023 දෙසැම්බර් 6 වන දින ගෝවා හි ඩෙම්පෝ ෂිප් බිල්ඩින්ග් ඇන්ඩ් ඉංජිනියරින් පෞද්ගලික සමාගමේ දී පැවැත්විණ. මෙම සුවිශේෂී අවස්ථාව සඳහා ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් ගෝපාල් බාග්ලේ මහතා, ශ්‍රී ලංකා නාවික හමුදාපති වයිස් අද්මිරාල් යූ. වී. එම්. පී. පෙරේරා මහතා සහ පාවෙන තාටාකය සඳහා වන ඒකාබද්ධ අධීක්ෂණ කමිටුවේ දෙරටෙහිම නියෝජිතයන් අන්තර්ජාලය ඔස්සේ සහභාගී වූහ.

2. මෙම අවස්ථාව අමතමින් මහ කොමසාරිස්තුමා අවධාරණය කළේ මෙම ව්‍යාපෘතිය ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර පවතින දිගු කාලීන සහයෝගීතාවයේ, සහෝදරත්වයේ සහ මිත්‍රත්වයේ බැඳීම් සංකේතවත් කරන බවයි. ඉන්දියාව කලාපයේ සැමට ආරක්ෂාව සහ වර්ධනය හෙවත් සාගර් (SAGAR) යන දැක්ම සහ “අසල්වැසියා ප්‍රථමයෙන්” යන ප්‍රතිපත්තිය සාක්ෂාත් කර ගැනීම උදෙසා ශ්‍රී ලංකාවේ ආරක්ෂක හමුදාවන්ගේ ධාරිතා ගොඩනැගීම සහ තිරසාර

සංවර්ධනය වෙනුවෙන් කැප වී කටයුතු කර ඇත. ශ්‍රී ලංකා නාවික හමුදාව සඳහා පාවෙන තටාකයක් ලබාදීමේ ව්‍යාපෘතිය ඉන්දියාවේ සහ ශ්‍රී ලංකාවේ නාවික හමුදාවන් අතර ශක්තිමත් බැඳීම් තවදුරටත් ඉහළ නංවා ඇති බව මහ කොමසාරිස්තුමා ප්‍රකාශ කළේය. මෙම පාවෙන තටාකය ශ්‍රී ලංකා නාවික හමුදාවේ සියලු නඩත්තු අවශ්‍යතාවයන් සපුරාලනු ඇති අතර එමගින් කලාපයේ සමුද්‍රීය ආරක්ෂාව ඉහළ නංවනු ඇත.

3. මෙම ව්‍යාපෘතිය යථාර්ථයක් බවට පත් කිරීමට දායක වූ සියලු පාර්ශවකරුවන්ට සිය ස්තුතිය පළ කළ මහ කොමසාරිස්තුමා ව්‍යාපෘතිය නිසි කලට අවසන් කිරීමට ලැබේවායි ප්‍රාර්ථනා කළේය. එසේම එතුමා භෞතිකව මෙන්ම අතථ්‍ය අයුරින් ද වැඩසටහන සංවිධානය කිරීම පිළිබඳව M/s ගෝවා ෂිප්යාඩ් ලිමිටඩ් ආයතනයට සිය ප්‍රශංසාව පුද කළේය.

4. ශ්‍රී ලංකා නාවික හමුදාව සඳහා පාවෙන තටාකය තිළිණ කිරීම දෙරට අතර වර්ධනය වන සහයෝගීතාවය සහ මිත්‍රත්වය පිළිඹිබු කරයි. ටොන් 4000ක පාවෙන තටාකය ශ්‍රී ලංකාවට ලබා දීම සදහා ඉන්දීය රජය සහ ශ්‍රී ලංකා රජය අතර ගිවිසුම 2022 මාර්තු 15 වන දින කොළඹ දී අත්සන් තබන ලදී. දිග මීටර් 115ක් දක්වා වන නෞකා පාවෙන තටාකයේ නැංගුරම් දැමිය හැකි අතර තටාකයේ එසවුම් ධාරිතාවය ටොන් 4000 කි.

***

***කොළඹ***
***2023 දෙසැම්බර් 08***